# අපේ සිසිර සරණිය





සිසිර දිසානායක

පන්හිඳයි, පින්සලයි, පැන්සලයි ඉන්න මෙල්බන් නගරයේ හරියටවත් අපේකලා කටයුතු ඒ වගේම සංවිධාන අපේ අයගේ සංවිධාන එක් ලක්ෂ විසිදහක් විතර අපේ අය මෙල්බන් නුවර ඉන්නවා කියලේ කියන්නේ. ඉතින් සංවිධාන අපේ වෙළඳ සැල් අපේ දේවල් උගන්වන ආයතන අපේ පන්සල් පල්ලි නැතිවම බෑ.

පහු ගියදාක අපූරු දෙයක් සිද්ධ වුණා. ඒ තමා අපේ දේවල්වල ආදරය කරන කෙනෙකුව අයග කිරිම. මේ උත්සවය බලන්න ගිහින් පන්, පින්, පැන් තුන්දෙනා අවේ හැඟීම් බර වුණ දේවල්වලින් හිත් පුරවාගෙන ගෙදරට එනකල් තුන්දෙනාම ගොළු වෙලා කඳුළු පෙරනවා, මඟ දිටගම ගෙදරට එන-කොට පාන්දර දෙක විතර වෙලා. තුන් දෙනාම එකතුවෙලා එළිවෙනකල්ම කළේ උත්සමේ ගැන කතා කර කර උන්නු එක. මොකද නින්ද ගියේ නෑ තුන් දෙනාටම.

''හෙළ මාත්‍රා'' සංස්කෘතික පදනමට මෙහෙම දෙයක් හිතුණ එකව වටිනා දෙයක් කෝපි කොප්ප තුනක් හදාගෙන එන ගමන් පන් කිව්වා නිර්මාණක-රුවා කවුරුවුණත්, මොන මට්ටමින් අගය කෙරුණක් තමින අතරෙ ඉඳගෙන තමන්ගේ දේවල්වලට අත හිත දෙන කෙනෙක්ව අගය කරන්න හිතපු එක වටිනා දෙයක්.''

''එහෙම කෙනෙකුගේ හෙවනැල්ල වාගේ ඉන්න බිරින්දෑවත් වේදිකාවට කැඳවලා අගය කරපු එකත් අළුත් හොඳ අදහසක් පැන් කෝපි කෝප්පය අතට ගන්න ගමන් කතාවට එකතු වුණා මධු නා-නායක්කාරත් දරුවන් කීප දෙනෙක්ගේ මවක්, ඒ වගේම බිරිඳක් නිසා ඒ වටිනාකම් හොඳින් දන්නවානේ.. සංවිධානයක කට්ටුවට එක්ක ගන්න තීරණවලට ඒ අදහස් එකතු වෙන්න ඇති.''

නිර්මාණකරුවාගේ හැකියාවල් ගණනාවක් ගැන මහාචාර්ය ප්‍රියාන් මෙන්ඩිස් ඉංජිනේරුවරයා, ජගත් ජේ. එදිරිසිංහ කලාකරුවා විජය කරුණාසේන චිත්‍ර ශිල්පියා, වගේ මහේන්ද්‍ර කාලිංග මුදලි පන්ති මිත්‍රයා කතාවල් පැවැත්තුවා අගය කරපු නිර්මා-ණකරුවා වගේම මේ දේශකයින් හැම දෙනාම ඉංජිනේරුවරු වුන එකත් අපූරු දෙයක් නිර්මා-ණකරුවා ගැන කතාකරන ආචාර්ය වික්ටර් රත්නායක, සම්මානිය මහාචාර්ය කුසුමා කරුණාරත්න, ආචාර්ය රෝහණ වීරසිංහ සහන් රන්වල කියන පිරිසගේ දර්ශන තිරයේ පෙන්නුවා.

''චිත්‍ර ගැන දර්ශන තිරයේ පවර් පොයින්ට් විදියට පෙන්නලා විජය මහත්තයා කරපු විග්‍රහය නම් අපූරුයි. අපේ තැනක මෙහෙම දෙයක් වුණාමයි. මං හිතන්නේ ''පින් සතුටින් ඉපිලෙනවා. මුලු උත්සවය පුරාම චිත්‍රවලට තැනක් දීලා ගාමිණි රණසිංහ මහත්තයාගේ වේදිකා සැරසිළිවල, මහේන්ද්‍ර කාලිංග මුදලි මහත්තයාගේ ප්‍රදර්ශන ආලින්දයේ... තැහ තැනම වේදිකා දසුන් ගජමත් මහත්තයාගේ ආලෝකය එළිය වෙලා. මගේ පොඩි කාලෙන් මට මතක් වුණා. ''පින් තවත් කියනවා.''

''සිත්තම් වගේම සිත්තරුත් නිහඬයි. ඒ නිහඬ අය කරන දේ ඉස්මතු කරලා පෙන්නක එක හරි වැදගත්.''

අය දුන්න දායකත්වය නිසා තමයි විල්ෆ්‍රඩ් සිරිවර්ධන මහත්තයාට ඔය තරම් සංයමයකින් උත්සවය මෙහෙයවන්න ලැබුණේ. පැන් උත්සවයේ තවත් පැනක් ගැන කතා කළා. විල්ෆඩ් වගේම රෙ-ිහණ කරුණාරත්න, ශිරෝමා ප්‍රනාන්දු මහේන්ද්‍ර කියන අය තමයි සංවිධානය කමිටුවේ ඉඳල තියෙන්නේ.

අසංක ලියනගේ සහෝදරයාගේ සංගීත මෙහෙ-යුමට සත්‍යත්වය නොකර වාදනය කරපු අපේ ගායක ගායිකාවනුත් අගය කරන් වටිනවා. ඒ වගේම නැටුම් ඉදිරිපත් කරනු රශිකා කුලසිංහ නැටුම් ගුරුවරියගේ කණ්ඩායම, පතිභා රංගන ආයතනයේ අසංක තිලකරත්න සරෝජනී ප්‍රනාන්දු ඇතුළු කණ්ඩායම, හෙළ මාත්‍රා සංස්කෘතික පදනමේ දරුවන් ගැනත් මතක් කරන්න ඕන. කෙවින් නානායක්කාර කුඩා පුතනුවන්ගේ ඒකල උඩරට නර්තනයක් අගය කළ යුතුයි.

''දරුවන් වෙනුවෙන් පවත්වපු චිත්‍ර තරඟයට චිත්‍ර සීයක් විතර ඉදිරිපත් කරලා තිබුණා. ඒ ගැන ලොකු උනන්දුවක් තියෙන එක ලොකු දෙයක් ''පින් තමන්ට දකුණු දේ කිව්වා. ''ළමයි වගේම දෙමව්පියනුත් උනන්දු වුණාලු ඒ ගැන. වයස් පරතර තුනකට බෙදලා ඇගයිමට ලක්වුණ නිර්මා-ණකරුවා ලියපු ගීත තුනක් මාතෘකා කරගෙනයි තරඟය පවත්වලා තියෙන්නේ. දිනපු චිත්‍ර තෝරපු විනිශ්චය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙන්න ඕන. වරුණ කාවින්ද මහත්තයාගේ ග්‍රැෆික් නිර්මාණන් අගෙයි.''

''මතකද නිර්මාණකරුවාගේ බිරිඳව වේදාකාවට කැඳවන්න කලින් රෝහණ කරුණාරත්න මහත්යා ගායනා කරපු අළුත් සින්දුව?'' පන් තවත් පැත්තක් ගැන මතක් කළා '' අගය කරණ නිර්මාණකරුවා ලියනු ඒ ගීයෙන් කියැවුනේ කලාකරුවන් සමාජ සේ-වකයින් පොදු වැඩවලට කැපවෙලා ඉන්න අතරේ ගෙදර දොර බලා ගියාගන්න තමුන්නෙ කාලය කැප කරන බිරින්දෑවරුන් නැත. නිර්මා-ණකරුව, ගීත රචකයේත් බවට පත් කරපු වික්ටර් රත්නායක මහත්තයාගේ ''හත් දාවන දා'' සින්දුවට රූප රාමු නිර්මාණය කරලා තිබුණේ ''ඔස් නිව්ස් ලංකා'' වෙබ් අඩවිය කරන චන්දිම ඩයනෙන්ති සොහොයුරා. ඇයි රුක්මල් නිරෝෂ් සෙහොයුරා රූප රතනය කරපු ''ගුගල් ගුලැවේ'' සින්දුව? ඒක ගායනා කළේ සරිනි දිසානායක තරුණිය. රඟපාන්න තරිඳු කාලිංගමුදලි තරුණයා එක් වුණා.''

අන්තිමට අගය කිරීමට ලක්වුණු කලාකරුවාට සමරු තිළිණ පිළිගැන්නුවා. ඒ මධු නානායක්කාර නෝනාගේ ස්තුති කතා පස්සෙයි. කවුද ඉතින් මේ විදියට අගය කෙරුණේ? සිසිර දිසානායක කියන නිර්මාණකරුවා සිසිර මේ අගය කිරිම දැක්කෙ වෙන විදියකට.

''සිසිරය කියන්නන් ගීත සෘතුවට. සරණිය කියන්නේ ගීත සෘතුවට සරණිය කියන එකෙන් අදහස් වෙන්නේ ''එකතුව'' කියන එක. සිසිර සරණිය කියන්නේ ගීත සෘතුවේ එක්වීමක් ඒත් ''හෙළ මාත්‍රා'' සංස්කෘතික පදනම මේ නම යොදගන්න ඇත්තේ ''සිසිරගේ නිර්මාණ එකතුව'' කියන අදහ-සිංන් වෙන්න ඇති. ඒත් ''සිසිර'' කියන්නේ එක් පුද්ගලයෙක් සමාජයක් තුලින් බිහිවුණු නියෝජිතයා''

''අඩුමගානේ අපට මුල්ම හුස්ම පොද ගන්න එකවත්, අවසන් හුස්ම හෙළන එකවත් තනියම කරගන්න බෑ අනික් අය නැතිව මේ නිර්මාණ කරන්න හැකියාව ලබාදුන්න වේදිකා කොතැනි හදලාදුන්න විශාල පිරිසකගේ සාමුහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ''සිසිර'' කියන්නේ'' නිර්මාණකරුවා තමන්ගේ දෙමව්පියන්, සහෝ දරියන්, ගම, ගමේ පාසැල. අගනුවර පාසැල, ගුරුවරුන්, පන්ති මිත්‍රයන්, ආදි ශිෂ්‍යයින්, තෘතියකික අධ්‍යාපනය ලබා වූ ආයතන, රැකියාව කරනු ආයතන යනාදී හැම දෙයක්ම නාමිකව සිහිපත් කළේ ඔවුන්ට ගරු කරන්නන් එක්ක. ඒ වගේම තමන්ට අති හිත දුන්න, වේදිකාව සකස් කරලා දුන්න පාසැල, ශිෂ්‍ය සංගම්, සංගීතවේදීන්, අනුග්‍රාහක හවතුන්, සමාජ සංවිධාන, ගායන කව යනාදිය ගැනත් සිහිපත් කළා. නාමිකවම ඒ වගේම තමන්ට මේ රටට එනන් පාර කියාදුන්න නෑයින් ගැන වගේම තමන්ගේ අඹුදරුවන් ගැන වචනයක් කියන්නට අමතක කළේ නෑ. කතාව ටිකක් දිග වගේ දැණුනත්, ''හෙළමාත්‍රා'' සංස්කෘතික පදනම සංවිධානය කරපු ''සිසිර සරණිය'' මේ විදියට අගය කළේ ''සිසිර'' කියන නම් පුද්ගලයෙක් නොවන බවත්, ඒ නාමිකව සඳහන් කළ අය වගේම තමන්ව අගය කර රසික, පාඨක, ප්‍රේක්ෂක හැම දෙනාම බවත් නිර්මාණකරුවා සඳහන් කළා. ඒ නිසා මේ කරපු සද්කාර්ය ඉතා වැදගත් බව කිව්වේ එයට දායක වුණ හැමෝම නාමිකව මතක් කරමින්.

''සිසිර '' කියන නිර්මාණකරුවාව ඇගයීම ගැන ''සිසිර'' කියන ලියන්නා සටහන් නොකළොත්''ක අර නිර්මාණකරුවාට ලියනාගෙන් වෙන අසාධ-ාරණයක්. මොකද ඒක කූඩුවක පාරවෙලා හිටියත් මෙත ඉන්නෙ කීප දෙනෙක් ඒක ඒ සංවිධානකය-ින්ට කෙරෙන අසාධාරණයක් වෙනවා. තමන්ගේ අදහසක් එක් කළා තමන්ගේ නිදහසටත් එක්ක.

නිර්මාණකරුවා ඉල්ලීමකුත් කළා. අගය කිරිම්වලට ලක් වුණාට තමන්ව වෙනම ඉහළ තැන තියලා තමන්ව දුරස් නොකරන් කියන ඉල්ලීමයි. ඒ තමන් හැමදාම බින්දුවේ ඉන්න නිසා පුරුදු විදියටම ඉඳිමු කියන ඉල්ලීමයි. ඒ හැමදාමවත් තමන් ''-අපේ සිසිර'' විදියටම කියා ගන්න සියල්ක ඉල්ලුවා. නිර්මාණකරුවා තමන්ගේ කතාව ඉවර කළේ ගීයක කොටසක් කියලා

''රත්තරන් කෙණ්ඩියේ
සිංහ තෙල් වගේ
මිනිස් ගුණේ සැම දා බැබලේ
එය රැකීම අප උරුමේ වේ.... ෟ

SBS සිංහල සේවය

SBS සිංහල සේවය සඳුදා,
අගහරුවාදා, බ්‍රහස්පතින්දා,
සිකුරාදා
පෙ.ව 11 සිට 12 දක්වා

සජීවව online අහන්න
www.sbs.com.au/radio - select - SBS radio 2 -Sinhalese

පසුව online අහන්න
www.sbs.com.au/sinhalese
සජීවව on TV - Channel 38

**සජීවව on Radio**
93.1fm - Victoria
97.7fm - NSW
105.5fm - Canberra
106.3fm - SA
93.3fm - QLD
96.9fm - WA

සජීවව හෝ පසුව via Mobile
SBS Radio APP - free download

SBS සිංහල Facebook පිටුව
www.facebook.com/sbssinhalese

කතාකරන්න - (03) 99492169
Fax කරන්න - (03) 99492385
කෙටි පණිවිඩ සඳහා - 042 999 6263
(වැඩසටහන ප්‍රචාරය වන වෙලාවේදී පමණි)

## ගිරිඋල්ල දැතව කනිටු විදුහලේ
# පුස්තකාලයට පොත් අවශ්‍යයි

"මට පොත් එවනවාට වඩා මා උගන්වන දුප්පත් පාසලේ පුස්තකාලයට පොත් ටිකක් ලබා ගන්නට වැඩ පිළිවෙලක් යෙදිය හැකි නම් එය විශාල සේවාවකි" යි කිව්යර ප්‍රියංකර නිවුන්හැල්ල මහතා අපට පැවසුවේ ඔහුට යම් පොතක් යවන්නට කතා කළ අවස්ථාවේදීය.

ඔහු උගන්වන්නේ ගිරිඋල්ල දැතව කණිටු විදුහලේ ය. පහසුකම් අඩු පාසලක් වන දැතව කණිටු විදුහලේ පුස්තකාලය සඳහා පොත්පත් ලබාගැනීමට සහය වන්නැයි අපි සන්නස පාඨක ඔබ සැමගෙන් ඉල්ලා සිටිමු. කණිටු විදහලක සිසුනට ප්‍රයෝජනවත් විය හැකි යයි ඔබ සිතන පොත් පත් ඔබ වෙත තිබේ නම් ඒවා සන්නසට බාර දෙන්න. මේ පොත් පත් තෝමස්ටවුන් ඇලෙක්සැන්ඩර් ඇවනියු හි සූරිය මාකටිං සර්විසස් ආයතනයට හෝ පහත සඳහන් ලිප-ිනයට ගෙනැවිත් බාරදිය හැකිය.

**Guss Australia Pty Ltd**
13/30 Tower Court Noble Park VIC 3174

සිංහල නවකතා කෙටිකතා කවි පොත් හෝ කුඩා ඉංග්‍රිසි පොත් මේ සඳහා සුදුසු යයි අපි සිතමු. පොත් ලබාදිය නොහැකි නම් ඔවුන්ට එම පොත් මිලට ගැනීම සඳහා මූල්‍යමය ආධ-ාරයක් කරන්නටද ඔබට හැකිය. ලැබෙන පොත් ලංකාවට නොමිලයේ යවන්නට මල්ටි ෆ්‍රේට් ආයතනයේ අරුණ විජේතුංග මහතා ඉදිරිපත් වී සිටියි. ඔවුනට ස්තුතියි

ඔබ ලබාදෙන කුඩා පොතක් දරුවකුගේ මුවේ අපූරු සිනා මලක් පුබුදුවනු ඇත. එය කොයිතරම් වටිනවාද?

වැඩි විස්තර සඳහා අමතන්න
ජගත් 0433 438 535